**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - 2017**

---------------------------------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.59,224,507 ක් වූ ස්ථාවර වත්කම් පන්තීන් 04 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2014/පුස/1/2016 (සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වටිනාකම රු.14,784,158 ක් වූ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් 2012 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,170,342 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.13,478,657 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,648,999 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වැය සඳහා රජයේ දායකය රු.8,273,000 කින් හා වෙනත් ආදායම් රු.9,569,976 කින් වැඩිවී තිබුණද සේවක පාරිශ්‍රමික රු.22,561,648 කින් හා වෙනත් වියදම් රු.9,968,831 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013,2014,2015 හා 2017 වර්ෂවල ඌනතාවයක් හා 2016 වර්ෂයේ අතිරික්තයක් ඇතිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික නැවත ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේ රු.108,316,019 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු.199,002,157 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ 2017 – 2021 කාල පරිච්ඡේදය සඳහා ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක 10 ක් යටතේ ක්‍රියාකාරකම් 44 ක් ඇතුළත්ව සකස් කර තිබුණු උපායමාර්ගික කළමනාකරණ සැලැස්මෙහි, එක් එක් වර්ෂයන් තුළ ඉටුකර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලිව දැක්වෙන ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) එම ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ (ඇ) අනුව අදාළ වර්ෂයේ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව පිළියෙල කර නොතිබූ අතර එක් එක් කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු මුදල සඳහන් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික ප්‍රගති වාර්තාවේ ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම්වලට අදාල ප්‍රගතිය පැහැදිලිව සඳහන් කර නොතිබුණු බැවින් නිමකළ කාර්යයන්, ඉටුකරමින් පවතින කාර්යයන් හා ඉටු නොකළ කාර්යයන් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය.

(ආ) ශිෂ්‍යයන් 120 කට අධ්‍යයන පහසුකම් සැපයිය හැකි විද්‍යායතනයට 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිසුන් 110 ක් බඳවාගෙන තිබූ අතර ඉන් පසු වසරින් වසර බඳවා ගෙන තිබුණු සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී 2015/2016 අධ්‍යයන වර්ෂයට සිසුන් 78 ක් බඳවාගෙන තිබූ අතර එයින් ද සිසුන් 10 දෙනෙකු පාඨමාලාව අතහැර ගොස් තිබුණි. ඒ හේතුවෙන් 2017 වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.662,460 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ කථිකාචාර්යවරුන් සහ නිලධාරීන් 36 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා වශයෙන් රු.7,072,733 ක මුදලක් වර්ෂය තුළ ගෙවා තිබුණි. එහෙත් මොවුන් කුමන පර්යේෂණ සඳහා දීමනා ලබා ගත්තේද යන්න විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම පර්යේෂණ අනුමත කිරීමට, ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට සහ අවසන් කළ පර්යේෂණවල වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍යවන පර්යේෂණ කමිටු 2017 වර්ෂය අවසාන වන තෙක්ම පිහිටුවා නොතිබුණි.

(ආ) විද්‍යායතනයේ බැංකු ජංගම ගිණුම් දෙකෙහි මාසික සාමාන්‍ය ශේෂය රු.19,277,097 සිට රු.52,316,563 දක්වා පරාසයක වූ අතර එම මුදල් විද්‍යායතනයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් හෝ ඵලදායී කාර්යයක යෙදවීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) වතුපිටිවල පිහිටි හෙක්ටයාර් 2.35 ක ඉඩමක් 2013 වර්ෂයේදී නිදහස් දීමනා පත්‍රයක් මඟින් විද්‍යායතනය වෙත ඔසු උයනක් පිහිටුවීම සඳහා ලබාදී තිබුණද ඖෂධීය ශාකවලින් සමන්විතව ක්‍රමවත් සැලැස්මකට අනුව ඔසු උයනක් සංවර්ධනය කර විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා ප්‍රයෝජනයට යොදාගෙන නොතිබුණි.

(ඈ) විද්‍යායතනයේ කාර්යමණ්ඩලය අනුමතවී තිබුණේ 2017 ඔක්තෝබර් මාසයේදී වුවත් ඊට ප්‍රථමයෙන් කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා 2017 අගෝස්තු 23 දින පුවත්පත් දැන්වීමක් පළකිරීමට රු.282,555 ක් වැයකර තිබුණි. එහෙත් අනුමත කාර්යමණ්ඩලය අනුව පුරප්පාඩු සංඛ්‍යාව වෙනස් වූයෙන් ඉහත තනතුරුවලට බඳවා ගැනීමට නොහැකි වී තිබුණු අතර ඒ අනුව මෙම වියදම අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය වෙත ලබා දී තිබුණ ප්‍රාග්ධන ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.204,868,277 ක වැය නොකළ ප්‍රාග්ධන ශේෂයක් පැවති අතර වර්ෂය ආරම්භයේදී ප්‍රමාණවත් මුදල් තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී රු.15,550,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාගෙන තිබීම හා වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.28,668,492 ක් වීම හේතුවෙන් වර්ෂය අවසානයේ රු.191,749,785 ක ප්‍රාග්ධන ප්‍රදාන ඌන උපයෝජිතව තිබුණි.

(ආ) ආයුර්වේද වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ පංචකර්ම පුහුණුවීම් කටයුතු සඳහා සහ පරිගණක කටයුතු පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 03 ක් 2010 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට එහි රු.1,214,142 ක ශේෂයක් පැවති අතර 2017 වර්ෂයේදී මෙම ප්‍රතිපාදන උපයෝජනය කරන බව ආයතනය විසින් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදීද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි .

## 5. තිරසර සංවර්ධනය

---------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 6.1 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

2017 වර්ෂයට අදාලව පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව තත්‍ය අගයන් සහ අයවැයගත අගයන් අතර සියයට 45 සිට සියයට 223 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සාර්ථක කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

ගිවිසුම්ගත මුදල රු.මිලියන 98.2 ක වූ අධ්‍යයන ගොඩනැගිල්ල සඳහා 2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා තිබුණු මුදල රු.21,993,862 ක් විය.ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 65 ක් වූ අතර 2018 ජනවාරි 16 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාලය 2018 මැයි 31 දින දක්වා දීර්ඝ කර තිබුණත් කොන්ත්‍රාත්කරු 2018 පෙබරවාරි 25 දින සිට එහි ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | අයවැය පාලනය | - | වර්ෂයේ ආදායම් හා වියදම් අඩුවෙන් පුරෝකථනය කර තිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | - | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම්. |
| (ඇ) | පාඨමාලා පැවැත්වීම | - | ශිෂ්‍යයන් බඳවා ගැනීම වසරින් වසර අඩුවීම හා පාඨමාලා හැරයන සිසුන් රඳවා ගැනීමේ වැඩසටහන් සැලසුම්කර නොමැතිවීම. |